جمعية خدمة المحتوى
الإسلامي باللغات

ضيوف الرحمن
hajjumrh.com



# ගමනක පිළිපැදිය යුතු විනය හා එයට අදාළ නීතිරීති

සිංහල

سنهالي

ضيوف الرحمن
hajjumrh.com

شركاء التنفيذ :

دار الإسلام | بيان الإسلام | رواد التراجم | المحتوى الإسلامي

يتاح طباعة هذا الإصدار ونشره بأي وسيلة مع الالتزام بالإشارة إلى المصدر وعدم التغيير في النص

Tel : +966 50 244 7000
info@islamiccontent.org
Riyadh 13245-2836
www.islamiccontent.org

ضيوف الرحمن
hajjumrh.com

## ගමනක පිළිපැදිය යුතු විනය හා එයට අදාළ නීතිරීති.

සියලු පැසසුම් විශ්වයේ පරමාධිපති අල්ලාහ්ට ම හිමි ය. අපගේ නබිවරයාණන් වන දේව දූත මුහම්මද් තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ උදවියටත් එතුමාණන්ගේ හිත මිතුරන් ඇතුළු සියලු දෙනා හටත් ශාන්තිය හා සමාදානය අත් වේවා!

**මේ සියල්ලට පසු:**

**මෙය ගමනක විනය හා ඒ හා බැඳුණු නීති පිළිබඳ සඳහන් කෙටි ලිපියකි. මෙහි මගියාට අවශ්‍ය බොහෝ දෑ පැහැදිලි කිරීමට අපි කැමැත්තෙමු.**

මෙය ගෞරවණීය අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා කෙරෙන අවංක සේවයක් ලෙස හා පොදුවේ මුස්ලිම්වරුන් හට ප්‍රතිලාභ ගෙන දෙන්නක් ලෙස පත් කර දෙන මෙන් අපි අල්ලාහ්ගෙන් ඉල්ලා සිටිමු.

විවිධ භාෂාවන්ගෙන් ඉස්ලාමීය අන්තගර්ත සේවා සංගමයේ අධ්‍යාපන කමිටුව

ضيوف الرحمن
hajjumrh.com

# පළමුව: ගමනක පිළිපැදිය යුතු විනය

හජ් වන්දනාව සඳහා හෝ වෙනත් නැමදුමක් ඉටු කිරීම සඳහා ගමන් කරන්නෙකු පහත සඳහන් කරුණු පිළිබඳ සැළකිලිමත් විය යුතුය.

## 1

**ගමන් කරන වේලාව, වාහනය, මඟී සගයින්, මාගර් බොහෝමයක් පිහිටා ඇත්නම් නිශ්චිත මාගර් දිශාව යනාදී කරුණු සම්බන්ධයෙන් යහපත අල්ලාහ්ගෙන් පැතිය යුතුය. ඒ සම්බන්ධයෙන් දැනුම ඇති සුදුසු පුද්ගලයින්ගෙන් විමසා දැන ගත යුතුය.**

හජ් හා උම්රා වන්දනාව යනු කිසිදු සැකයකින් තොරව යහපත් ගමන් දෙකකි. **යහපත පැතීමේ ක්‍රමය වනුයේ:** රකඅාත් දෙකක් ඉටු කර පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසින් සඳහන් කර ඇති ප්‍රාථර්නාවන් පැතීමය.



## 2 හජ් ඉටු කරන හෝ උම්රා ඉටු කරන අයකු තම හජ් හා උම්රාව උත්තරීතර අල්ලාහ් වෙනුවෙන් පමණක් ඉටු කරන බවට හා ඔහු වෙතට පමණක් සමීප වන බවට අධිෂ්ඨාන කර ගැනීම අනිවාර්ය වේ.

ලොවේ විනාශ වී යන අල්ප දෑ සඳහා හෝ ආඩම්බර කම හෝ විශේෂ නාමයක් ලැබීම හෝ ප්‍රදශර්නය කිරීම හෝ මුහුණිච්ඡාව එමගින් අපේක්ෂා කිරීමෙන් වැළකී සිටිය යුතුය. හේතුව ඒවා සිදු කරන ක්‍රියාවන් නිෂ්පළ වී යාමට හා එය පිළිගනු නො ලැබීමට හේතු සාධකයක් වන බැවිනි.

උත්තරිතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

﴿قُلۡ إِنَّمَآ أَنَا۠ بَشَرٞ مِّثۡلُكُمۡ يُوحَىٰٓ إِلَيَّ أَنَّمَآ إِلَٰهُكُمۡ إِلَٰهٞ وَٰحِدٞۖ فَمَن كَانَ يَرۡجُواْ لِقَآءَ رَبِّهِۦ فَلۡيَعۡمَلۡ عَمَلٗا صَٰلِحٗا وَلَا يُشۡرِكۡ بِعِبَادَةِ رَبِّهِۦٓ أَحَدَۢا﴾

"මම නුඹලා මෙන් මිනිසෙකු පමණි. නුඹලාගේ දෙවිඳුන් එකම දෙවිඳෙකු යැයි මා වෙත දන්වනු ලැබ ඇත. එහෙයින් කවරෙකු තම පරමාධිපතිගේ හමු ව අපේක්ෂා කරන්නේ ද ඔහු දැහැමි ක්‍රියාවන් සිදු කරත්වා! තම පරමාධිපතිට ගැතිකම් කිරීමෙන් කිසිවකු ආදේශ නොකරත්වා!" යැයි (නබිවරය,) නුඹ පවසනු. (අල් කහ්ෆ්: 110)

අල්-හදීස් අල්-කුද්සි හෙවත් දේව ප්‍රකාශ සඳහන් හදීසයක මෙසේ ප්‍රකාශ වී ඇත.

«أَنَا أَغْنَى الشُّرَكَاءِ عَنِ الشِّرْكِ، مَنْ عَمِلَ عَمَلًا أَشْرَكَ فِيهِ مَعِي غَيْرِي تَرَكْتُهُ وَشِرْكَهُ»[1].

**"ආදේශකයන්ගේ ආදේශයෙන් මම ස්වාධීන වෙමි. කවරෙකු මා සමග, මා හැර වෙනත් කෙනෙකු හවුල් කරමින් ක්‍රියාවක් සිදු කළේ ද සැබැවින්ම මම ඔහුව ද ඔහුගේ ආදේශය ද අතහැර දැමුවෙමි."[1]**



(1) ඉමාම් මුස්ලිම් තුමා විසින් හදීස් අංක (2985) යටතේ වාතර්ා කරන ලදි.

## 3

**හජ් ඉටු කරන්නා හා උම්රා ඉටු කරන්නා, හජ් හා උම්රා හි නීතිරීති මෙන්ම, ගමනක පිළිපැදිය යුතු නීතිරීති පිළිබඳ අවබෝධය ලබා තිබිය යුතු ය.**

එය එහි අනිවායර්ය ක්‍රියාවක් මඟ නො හරිනු පිණිස හා තහනම් දෙයක නො වැටෙනු පිණිසය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ:

«مَنْ يُرِدِ اللهُ بِهِ خَيْرًا يُفَقِّهْهُ فِي الدِّينِ».[2]

**"අල්ලාහ් කවරෙකුට යහපත පතන්නේ ද, ඔහු ඔහුට දහම තුළ අවබෝධය පිරිනමනු ඇත."**[2]

## 4

**හජ් හෝ උම්රා ඉටු කරන්නා තම හජ් හා උම්රා වෙනුවෙන් නිත්‍යානුකූල ලෙස උපයා ගත් මුදල් තෝරා ගත යුතුය. මක්නිසාදයත් අල්ලාහ් පිවිතුරුය, පිවිතුරු දෑ හැර වෙනත් කිසිවක් ඔහු පිළිනොගන්නා බැවිනි.**

එමෙන්ම තහනම් ඉපැයීම්, ප්‍රාථර්නාව ප්‍රතික්ෂේප වීමට හේතුවක් වන බැවිනි.

## 5

**සියලුම පාපකම් හා වැරදි සඳහා පාපක්ෂමාව පැතීම, ජනයාට යම් අසාධාරණයක් තමන් විසින් සිදු වී ඇත්නම් එය ඔහුට නැවත ලබා දීම, එයින් ඔවුන්ව නිදහස් කිරීම.**

එය මානාය හෝ ධනය හෝ ඒ හැර වෙනත් දෙයක් වුව ද එසේමය.

## 6

**මගියා තම අන්තිම කැමැත්ත, තමන් සතු දෑ හා තමන්ට ලැබිය යුතු /තමන් ගෙවිය යුතු දෑ ලියා තැබීම.**

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ:

---

(2) මෙය ඉමාම් බුහාරි විසින් හදීස් අංක (2738) යටතේ වාතර්ා කර ඇති අතර, ඉමාම් මුස්ලිම් විසින් ද හදීස් අංක (1627) යටතේ වාතර්ා කර ඇත.

«مَا حَقُّ امْرِئٍ مُسْلِمٍ لَهُ شَيْءٌ يُوصِي فِيهِ يَبِيتُ لَيْلَتَيْنِ إِلَّا وَوَصِيَّتُهُ مَكْتُوبَةٌ عِنْدَهُ»[3].

**"යමක් සම්බන්ධයෙන් අන්තිම කැමැත්ත පවසන්නට මුස්ලිම්වරයකුට යමක් තිබී, ඔහුගේ අන්තිම කැමැත්ත ඔහු ඉදිරියේ ලියනු ලැබීමෙන් තොරව රාත්‍රී දෙකක් ගත කිරීම සුදුසු නොවන්නේය."[3]**

ඒ සඳහා සාක්ෂිකරුවකු නියම කර ගනියි. ඔහු මත පැවරුණු ණය පියවයි. තැන්පතු ඒවායෙහි අයිතිකරුවන්ට නැවත භාර දෙයි. එසේ නැතහොත් ඒවා තබා ගැනීමට ඔවුන්ගෙන් අවසර පතයි.

## 7

## මගියා දැහැමි මගී මිතුරෙකු තෝරා ගැනීමට උනන්දු වීම සතුටු දායක වේ. ආගමික දැනුම සෙවීමට ද උනන්දු විය යුතුය.

සැබැවින්ම එය ඔහු ආශිවර්ාද ලැබීමටත් ඔහුගේ ගමනෙහි හා හජ් උම්රා කටයුතුවලදී වැරදි කිරීමෙහි නොවැටීමට හේතුවක් වනු ඇත. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ:

«الرَّجُلُ عَلَى دِينِ خَلِيلِهِ، فَلْيَنْظُرْ أَحَدُكُمْ مَنْ يُخَالِلُ»[4]؛

**“මිනිසා තම කල්‍යාණ මිතුරාගේ දහම මත සිටියි. එබැවින් ඔබ අතරින් කිසිවකු හෝ වේවා තම කල්‍යාණ මිතුරන් වන්නේ කවුරුන්දැයි මැනවින් බලත්වා!”[4]**

තවද නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ තවත් ප්‍රකාශයක් මෙසේය.

«لَا تُصَاحِبْ إِلَّا مُؤْمِنًا، وَلَا يَأْكُلْ طَعَامَكَ إِلَّا تَقِيٌّ»[5].

**"දේවත්වය විශ්වාස කරන මුඃමින්වරයකු හැර අන් කිසිවෙකු සමඟ මිත්‍රත්වයක් ඇති කර නො ගන්න. භක්තිමත් පුද්ගලයෙකුට හැර අන් කිසිවෙකුට ඔබේ ආහාර අනුභව කිරීමට ඉඩ නොදෙන්න."[5]**

(3) මෙය අබූ දාවූද් විසින් හදීස් අංක (4833) යටතේ වාතර්ා කර ඇත.

(4) මෙය අබූ දාවූද් විසින් හදීස් අංක (4832) යටතේ හා තිර්මිදි තුමා විසින් හදීස් අංක (2395) යටතේ වාතර්ා කර ඇත.

(5) මෙය අත්-තබරානී තුමා විසින් හදීස් අංක (823) යටතේ වාතර්ා කර ඇත.



8

## මගියා තම පවුලට, තම ඥාතීන්ට, තම අසල්වැසියන්ට හා තම මිතුරන්ට සමුදීම සතුටුදායක වේ.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ:

«مَنْ أَرَادَ أَنْ يُسَافِرَ فَلْيَقُلْ لِمَنْ يُخَلِّفُ: أَسْتَوْدِعُكُمُ اللهَ الَّذِي لَا يُضِيعُ وَدَائِعَهُ»(6)،

**කවරෙකු ගමනක් යෑමට අපේක්ෂා කළේ ද ඔහු ඇරලවන්නන් හට මෙසේ පවසයි.**

أَسْتَوْدِعُ اللهَ دِينَكَ وَأَمَانَتَكَ وَخَوَاتِيمَ عَمَلِكَ

**"අස්තව්දිඋල්ලාහ දීනක වඅමානතක වහඃවාතීමු අමලික"**

**(තේරුම: ඔබේ දහම, ඔබේ සුරක්ෂිතභාවය හා ඔබේ ක්‍රියාවන්හි අවසානය අල්ලාහ්ට භාර කර සමුගෙන යමි.)**[6][7]

තම මිතුරන් අතරින් කිසිවෙකු හෝ ගමනක් යෑමට අපේක්ෂා කළ විටෙක, නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ඔහුට සමු දෙමින් මෙසේ ප්‍රාර්ථනා කරන්නට වූහ.

«أَسْتَوْدِعُ اللهَ دِينَكَ وَأَمَانَتَكَ وَخَوَاتِيمَ عَمَلِكَ»(7)،

**"අස්තව්දිඋල්ලාහ දීනක වඅමානතක වහඃවාතීමු අමලික"**

**(තේරුම: ඔබේ දහම, ඔබේ සුරක්ෂිතභාවය හා ඔබේ ක්‍රියාවන්හි අවසානය අල්ලාහ්ට භාර කර සමුගෙන යමි.)**

මගීන් අතරින් කිසිවෙකු හෝ ඔහුට උපදෙස් දෙන මෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් ඉල්ලා සිටි විට, එතුමාණෝ මෙසේ පවසා සිටියහ:

---

(6) මෙය තිර්මිදි තුමා විසින් හදීස් අංක (3444) යටතේ වාතර්ා කර ඇත.

(7) මෙය අහ්මද් තුමා තම මුස්නද් නම් කෘතියෙහි හදීස් අංක (4524) යටතේ වාතර්ා කර ඇත.

«زَوَّدَكَ اللهُ التَّقْوَى، وَغَفَرَ ذَنْبَكَ، وَيَسَّرَ لَكَ الخَيْرَ حَيْثُ مَا كُنْتَ»(8)

**"සzව්වදකල්ලාහුත් තක්වා, වගෆර දන්බක, වයස්සර ලකල් හෑයිර හයිසු මා කුන්ත"**
**(තේරුම: අල්ලාහ් ඔබට බියබැතිකම පිරිනමත්වා. ඔබේ පවට සමාව දෙත්වා. ඔබ කොතැනක සිටිය ද ඔබට යහපත ලෙහෙසි පහසු කර දෙත්වා!)**[8]

ගමනක් යන්නට සිතා මිනිසකු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ, "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! මට උපදෙස් දෙන්නැ"යි පවසා සිටියේය. එවිට එතුමාණෝ මෙසේ පැවසූහ:

«أُوصِيكَ بِتَقْوَى اللهِ، وَالتَّكْبِيرِ عَلَى كُلِّ شَرَفٍ» فَلَمَّا مَضَى قَالَ: « اللَّهُمَّ ازْوِ لَهُ الْأَرْضَ، وَهَوِّنْ عَلَيْهِ السَّفَرَ»(9).

**අල්ලාහ්ට බිය බැතිමත් වන ලෙසත්, සෑම උස් ස්ථානයක අල්ලාහු අක්බර් යැයි තක්බීර් පවසන ලෙසත්, මම ඔබට උපදෙස් දෙමි. ඔහු එතැනින් ගිය කල්හි, එතුමාණෝ මෙසේ පැවසූහ:**

اللَّهُمَّ ازْوِ لَهُ الْأَرْضَ، وَهَوِّنْ عَلَيْهِ السَّفَرَ

**"අල්ලාහුම්මස්වි ලහුල් අළර් වහව්වින් අලයිහිස් සෆර"**
**(අහෝ දෙවිඳුනි, ඔහුට පොළොව පහසු කර, ගමනද පහසු කර දෙන්න.)**[9]

9

**ගමනේදී ඔහු සමග ගෙජ්ජි, සංගීත භාණ්ඩ,** සුනඛයින් වැනි දෑ රැගෙන නොයා යුතුය. එය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා වාතර්ා කළ හදීසයකට අනුවය.

«لَا تَصْحَبُ الْمَلَائِكَةُ رُفْقَةً فِيهَا كَلْبٌ وَلَا جَرَسٌ»(10).

**“සුනඛයෙක් හෝ සීනුවක් හෝ ඇති කණ්ඩායමක් සමග මලක්වරුන් සම්බන්ධතාවන් පවත්වන්නේ නැත.”**[10]

(8) මෙය අහ්මද් තුමා විසින් තම මුස්නද් නම් කෘතියෙහි හදීස් අංක (9724) යටතේ වාතර්ා කර ඇත.
(9) මෙය ඉමාම් මුස්ලිම් තුමා විසින් හදීස් අංක (2113) යටතේ වාතර්ා කර ඇත.
(10) මෙය ඉමාම් බුහාරි විසින් හදීස් අංක (2593) යටතේ ද ඉමාම් මුස්ලිම් විසින් ද හදීස් අංක (2770) යටතේ ද වාතර්ා කර ඇත.

## 10

**යමෙකුට බිරියන් කිහිප දෙනෙකු සිටින විටෙක, ඔහුගේ එක් බිරියක් සමග ගමනක නිරත වන්නට ඔහු අපේක්ෂා කළේ නම්, එවිට කුසපත් ඇද කවර බිරියගේ කුසපත තෝරා ගනු ලබන්නේ ද ඇය ඔහු සමග පිටත්ව යයි.**

එය ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමියගේ හදීසයකට අනුවය:

«كَانَ رَسُولُ اللهِ صلى الله عليه وسلم: إِذَا أَرَادَ سَفَرًا أَقْرَعَ بَيْنَ نِسَائِهِ، فَأَيَّتُهُنَّ خَرَجَ سَهْمُهَا خَرَجَ بِهَا مَعَهُ» [11].

**"අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් යම් ගමනක් යන්නට අපේක්ෂා කළ විට, තම බිරියන් අතර කුසපත් අදියි. ඔවුන් අතර කවර බිරියගේ කොටස තෝරා ගනු ලබන්නේ ද ඇය සමග එතුමාණන් පිටත්ව යයි."**[11]

## 11

**පහසුකමක් ඇත්නම් බ්‍රහස්පතින්දා දහවල් ආරම්භයේ ගමන සඳහා පිටත්ව යෑම සතුටු දායකය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ එසේ සිදු කර ඇත්තාහ.**

කඃබ් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පවසයි:

«لَقَلَّمَا كَانَ رَسُولُ اللهِ صلى الله عليه وسلم يَخْرُجُ إِذَا خَرَجَ فِي سَفَرٍ إِلَّا يَوْمَ الْخَمِيسِ» [12].

**"අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ගමනක පිටත්ව යන්නට අදහස් කළ විට, බ්‍රහස්පතින්දා දිනයේ හැර වෙනත් දිනවල එසේ පිටත්ව යන්නේ කලාතුරකිනි."**[12]

---

(11) මෙය ඉමාම් බුහාරි විසින් හදීස් අංක (2949) යටතේ වාතර්ා කර ඇත.

(12) මෙය අබූ දාවූද් තුමා විසින් හදීස් අංක (5094) යටතේ වාතර්ා කර ඇත.

## 12

## ගමනක් යන අවස්ථාවක හා වෙනත් අවස්තාවක නිවසින් බැහැර වීමේ දී පැවසිය යුතු ප්‍රාර්ථනාව උසුරීම සතුටුදායක ක්‍රියාවක් වේ.

ඔහු ඉන් පිටත් වන විට මෙසේ පවසයි:

«بِسْمِ اللهِ، تَوَكَّلْتُ عَلَى اللهِ، وَلا حَوْلَ وَلا قُوَّةَ إِلَّا بِاللهِ، اللَّهمَّ إِنِّي أَعُوذُ بِكَ أَنْ أَضِلَّ أَوْ أُضَلَّ، أَوْ أَزِلَّ أَوْ أُزَلَّ، أَوْ أَظْلِمَ أَوْ أُظْلَمَ، أَوْ أَجْهَلَ أَوْ يُجْهَلَ عَلَيَّ»[13].

"බිස්මිල්ලාහි තවක්කල්තු අලල්ලාහි වලාහව්ල වලාකුව්වත ඉල්ලා බිල්ලාහ්, අල්ලාහුම්ම ඉන්නී අවූදු බික අන් අදිල්ල අව් උදිල්ල අව් අසිල්ල අව් උසිල්ල අව් අද්ලිම අව් උද්ලම අව් අජ්හල අව් යුජ්හල අලෙයිය."

(අල්ලාහ්ගේ නාමයෙන් (පිටත්වෙමි,) මගේ කායර්යන් සියල්ල සම්පූණර්යෙන් අල්ලාහ් වෙත භාරකර ඔහුවම විශ්වාස කරමි. තවද අල්ලාහ් හැර වෙනත් කිසිදු ශක්තියක් හෝ බලයක් නැත. යා අල්ලාහ් මා මංමුළාවීම හෝ මා අවමානයට ලක්වීම හෝ අසාධාරණය කිරීම හෝ මා අසාධාරණයට ලක්වීම, මා මන්ද බුද්ධිකයකු වීම හෝ මන්ද බුද්ධිකයකු බවට පත්කරනු ලැබීම යනාදියෙන් මාව ආරක්ෂා කරනු මැනව)[13]

---

(13) වංසාඉස් සෆරි: එහි ඇතිවන දුෂ්කරතාවය. සහීහ් ග්‍රන්ථවල සඳහන් අතර්යෙන් මෙය පැහැදිලි කරන ලදී. (4/284)

## 13

## ගමනේ කිව යුතු ප්‍රාර්ථනාව උසුරීම ද සතුටු දායක ක්‍රියාවකි.

ඔහු සත්වයා මත හෝ වාහනය මත හෝ ගුවන් යානය මත හෝ වෙනත් වාහනයක් මත නගින විට මෙසේ පවසයි:

«اللهُ أَكْبَرُ، اللهُ أَكْبَرُ، اللهُ أَكْبَرُ ثُمَّ يَقُولُ: {سُبْحَانَ الَّذِي سَخَّرَ لَنَا هَذَا وَمَا كُنَّا لَهُ مُقْرِنِينَ وَإِنَّا إِلَى رَبِّنَا لَمُنْقَلِبُونَ} [الزخرف: ١٤] اللَّهُمَّ إِنَّا نَسْأَلُكَ فِي سَفَرِنَا هَذَا الْبِرَّ وَالتَّقْوَى، وَمِنَ الْعَمَلِ مَا تَرْضَى، اللَّهُمَّ هَوِّنْ عَلَيْنَا السَّفَرَ، وَاطْوِ عَنَّا بُعْدَهُ، اللَّهُمَّ أَنْتَ الصَّاحِبُ فِي السَّفَرِ، وَالْخَلِيفَةُ فِي الْأَهْلِ، اللَّهُمَّ إِنِّي أَعُوذُ بِكَ مِنْ وَعْثَاءِ السَّفَرِ، وَكَآبَةِ المنظر، وسوء الْمُنْقَلَبِ فِي الْمَالِ وَالْأَهْلِ..».[17]

"අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, සුබ්හානල්ලදී සඛ්ඛර ලනා හාදා වමා කුන්නා ලහු මුක්රිනීන් වඉන්නා ඉලා රබ්බිනා ලමුන්කලිබූන්. අල්ලාහුම්ම ඉන්නා නස්අලූක ෆී සෆරිනා හාදල් බිර්ර් වත්තක්වා වමිනල් අමලි මා තළර්ා. අල්ලාහුම්ම හව්වින් අලයිනා සෆරනා හාදා වත්වි අන්නා බුඃදහු. අල්ලාහුම්ම අන්තස් සාහිබු ෆිස් සෆරි වල්-කලීෆතු ෆිල්-අහ්ලි, අල්ලාහුම්ම ඉන්නී අඌදුබික මින් වඃසාඉස්-සෆරි ව වකඅබතිල්-මන්ළරි වසූඉල් මුන්කලබි ෆිල් මාලි වල්-අහ්ලි."

තේරුම: අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය, අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය, අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය, මෙය අප හට වසඟ කර දුන්නාවූ (අල්ලාහ්) සුවිශුද්ධය. ඒ සඳහා කිසිම හැකියාවක් අපට නොමැත. නියත වශයෙන්ම අපගේ පරමාධිපති වෙතම අපි නැවත යා යුත්තෝ වෙමු. යා අල්ලාහ්! මෙම ගමනේදී යහපතද බියැබතිමත්භාවයද ක්රියාවලින් ඔබ පිළිගන්නා දෑද ඔබෙන් අයැද සිටින්නෙමු. තවද යා අල්ලාහ්! අපේ මෙම ගමන පහසු කරනු මැනව. එහි දුර කෙටිකර දෙනු මැනව. මෙම ගමනේ සගයා උරුමකරු ඔබයි. පවුලේ නියෝජිතයාද ඔබයි. යා අල්ලාහ්! මෙම ගමනින් සිදුවිය හැකි වෙහෙසෙන්ද මගේ ඉරියව්වල වෙනස්වීමෙන්ද මගේ පවුලට හා මගේ ධනයට සිදුවිය හැකි නරකින්ද ආරක්ෂා කරන මෙන් මා ඔබෙන් පතමි.)[14][15][16][17]

---

(14) වකආබතිල් මන්ළරි: නපුරු ස්වරූප හා දුකින් පීඩාවට පත්වන සිදුවීම් ය. සහීහ් ග්‍රන්ථවල සඳහන් අතර්යෙන් මෙය පැහැදිලි කරන ලදී. (4/284)

(15) වසූඉල් මුන්කලිබි: නැවත හැරීම. සහීහ් ග්‍රන්ථවල සඳහන් අතර්යෙන් මෙය පැහැදිලි කරන ලදී. (4/284)

(16) මෙය අහ්මද් තුමා තම මුස්නද් නම් කෘතියෙහි හදීස් අංක (6374) යටතේ වාතර්ා කර ඇත.

(17) මෙය ඉමාම් බුහාරි විසින් හදීස් අංක (2998) යටතේ වාතර්ා කර ඇත.



## 14 මගී සහායකයකු නොමැතිව තනිව ගමන් නො කිරීම සතුටුදායක ය.

එය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කළ ප්‍රකාශයකට අනුවය.

«لَوْ يَعْلَمُ النَّاسُ مَا فِي الْوَحْدَةِ مَا أَعْلَمُ مَا سَارَ رَاكِبٌ بِلَيْلٍ وَحْدَهُ»[18].

"තනිව ගමන් කිරීම ගැන මා දන්නා දෑ මිනිසුන් දැන ගන්නේ නම්, රාත්‍රියේ කිසිදු මගියකු තනිව ගමන් නොකරනු ඇත."[18]

(18) මෙය අබූ දාවුද් විසින් හදීස් අංක (2608) යටතේ වාතර්ා කර ඇත.

15

## මගීන් ඔවුන් අතර නායකයකු පත් කර ගනියි:

එය ඔවුන් සියලු දෙනා ඔහු විසින් එක්රැස් කිරීම පිණිසය. එමෙන්ම ඔවුන් එකඟතාවට ගෙන ඒමට වඩාත් ශක්තිමත් වන අතර ඔවුන්ගේ අරමුණු ළඟා කිරීමට බලවත් වනු ඇත.

අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙසේ පැවසූහ:

«إِذَا خَرَجَ ثَلَاثَةٌ فِي سَفَرٍ فَلْيُؤَمِّرُوا أَحَدَهُمْ»[19].

**"යම් ගමනක තිදෙනෙකු පිටත්ව ගිය විට, ඔවුන් අතරින් එක් අයකු නායකයකු බවට ඔවුහු පත් කර ගත යුතුය."**[19]

---

(19) මෙය අහ්මද් තුමා තම මුස්නද් නම් කෘතියෙහි හදීස් අංක (17736) යටතේ වාතර්ා කර ඇත.



## 16

**අල්ලාහ් නියම කළ අවනත වීම් ක්‍රියාත්මක කිරීමටත් ඔහු තහනම් කළ දැයින් වැළකී සිටීමටත් වගබලා ගත යුතුය. එමෙන්ම උසස් සාදාචාර ගතිගුණවලින් හැසිරිය යුතුය.**

උදව් උපකාර අවශ්‍ය අයට උදව් කළ යුතුය. දැනුම සොයන අය හා ඒ වෙත අවශ්‍යතාවෙන් පෙළෙන අය වෙනුවෙන් වියදම් කළ යුතුය. ඔහුගේ මුදල් සම්බන්ධයෙන් ත්‍යාගශීලී විය යුතුය. තමන්ගේ යහපත වෙනුවෙන් හා තම සහෝදරයන්ගේ යහපත මෙන්ම අවශ්‍යතා වෙනුවෙන් වියදම් කළ යුතුය.

## 17

**අතැම් විට අවශ්‍යතාවයක් මතු විය හැකි බැවින් හා කරුණු වෙනස් විය හැකි බැවින්,**

ඔහු තම වියදමට අවශ්‍ය දෑ සහ ගමනට අවශ්‍ය දෑ වැඩි කර ගත යුතුය.



## 18

**එහි දී තම මගී මිතුරාට සතුට ගෙන දෙන පරිදි ප්‍රීතිමත් මුහුණකින් හා යහපත් මනසකින් යුතුව කටයුතු කළ යුතුය.**

එවිට ඔහු හිතවත් සෙනෙහෙබර කෙනකු විය හැක.

## 19

**තම සහෝදරයා විසින් සිදු වන අපහාස මෙන්ම ඔහුගේ මතයට විරුද්ධ වූ කලක ඉන් ඇති වන අපහසුතා ගැන ඉවසා දරා ගත යුතුය.**

වඩාත් යහපත් දැයින් ඔවුන් සමග කටයුතු කළ යුතු ය. එවිට ඔහු ඔවුන් අතර ගෞරවාන්විත අයකු වන අතර ඔවුන්ගේ සිත් තුළ ඔහු ගැන ගෞරවයක් ඇති වනු ඇත.

## 20

**මගීන් එක් තැනකට ගොඩ වැදුනු විටෙක, ඔවුන් එකිනෙකා කිට්ටුවෙන් එකට සිටිය යුතු ය.**

සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ සගයින් එක් තැනකට ගොඩ වැදුනු විට ඔවුන් මිටියාවත් හා නිම්න අතර වෙන්ව ගියහ.

එවිට (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ:

«إِنَّ تَفَرُّقَكُمْ فِي الشِّعَابِ وَالْأَوْدِيَةِ إِنَّمَا ذَلِكُمْ مِنَ الشَّيْطَانِ»[20]،

**"මෙම මිටියාවත් හා මංමාවත් තුළ නුඹලා බෙදී වෙන්ව යන්නේ නම් එය ෂෙයිතාන්ගෙන් වූවකි."** [20]

පසුව ඔවුහු එකිනෙකා අනෙකාට කිට්ටුවෙන් සමීපයෙන් සිටියහ. එය ඔවුන් අතර රෙදි කඩක් එළුවේ නම් ඔවුන්ට එය ප්‍රමාණවත් වන තරමටම විය.

## 21

**ගමනේ දී යම් තැනකට හෝ වෙනත් යම් නිවසකට හෝ ගොඩ වූ විටෙක නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සහතික කළ ප්‍රාථර්නාවන් උසුරීම යෝග්‍ය ය.**

---

(20) මෙය ඉමාම් මුස්ලිම් විසින් හදීස් අංක (2708) යටතේ වාතර්ා කර ඇත.

«أَعُوذُ بِكَلِمَاتِ اللهِ التَّامَّاتِ مِنْ شَرِّ مَا خَلَقَ»[21]؛

"අඌදු බිකලිමාතිල්ලාහිත් තාම්මාති මින් ෂර්රි මා හැලක්"
(අල්ලාහ්ගේ පරිපූර්ණ වදන් තුළින් ඔහු මැවූ දැහි හානියෙන් මම ආරක්ෂාව පතමි.)[21]

ඔහු එසේ පැවසුවහොත්, ඔහු එම නිවසින් පිටව යන තුරු ඔහුට කිසිවක් හානියක් නොකරනු ඇත.

## 22

**ඔහු උස් ස්ථානවල නැග යන විට 'අල්ලාහු අක්බර්' (අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයි) යැයි පැවසීම සහ පහත් ස්ථාන සහ නිම්න අතරින් බැස යන විට 'සුබ්හානල්ලාහ්' (අල්ලාහ් සුවිශුද්ධය) යැයි පැවසීම සතුටු දායකය.** ජාබිර් (රළියල්ලාහු අන්හු) මෙසේ පැවසීය:

"අපි නගින විට (අල්ලාහු අක්බර් යැයි) තක්බීර් පැවසුවෙමු. තවද අපි බසින විට (සුබ්හානල්ලාහ් යැයි) තස්බීහ් පැවසුවෙමු."[22]

ඔවුන් තක්බීර් පැවසීම උස් හඬින් හඬ අවදි නොකළ යුතුය. සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මෙසේ පැවසූහ:

«يَا أَيُّهَا النَّاسُ ارْبَعُوا عَلَى أَنْفُسِكُمْ فَإِنَّكُمْ لَا تَدْعُونَ أَصَمَّ وَلَا غَائِبًا إِنَّهُ مَعَكُمْ إِنَّهُ سَمِيعٌ قَرِيبٌ»[23].

"අහෝ ජනයිනි! ඔබ (සැහැල්ලු හඬින්) මෘදු ලෙස කටයුතු කරන්න. හේතුව සැබැවින්ම ඔබ ඇරයුම් කරන්නේ බිහිරෙකු හෝ පෙනී නොසිටින කෙනෙකුට නොවේ. සැබැවින්ම ඔහු ඔබ සමගම සිටී. සැබැවින්ම ඔහු සවර් ශ්‍රාවකය; ඉතා සමීපතය."[23]

## 23

**ගමන අතරවාරයේ රාත්‍රී කාලයේ විශේෂයෙන්ම එහි ආරම්භයේ ගමන් කිරීම සතුටු දායකය.** එය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ප්‍රකාශයට අනුගතවය:

---

(21) මෙය ඉමාම් බුහාරි විසින් හදීස් අංක (2994) යටතේ වාතර්‍ා කර ඇත.
(22) මෙය ඉමාම් බුහාරි විසින් හදීස් අංක (2993) යටතේ වාතර්‍ා කර ඇත.
(23) මෙය අබූ දාවුද් විසින් හදීස් අංක (2571) යටතේ වාතර්‍ා කර ඇත.

«عَلَيْكُمْ بِالدُّلْجَةِ؛ فَإِنَّ الْأَرْضَ تُطْوَى بِاللَّيْلِ»(24).

"ඔබ රාත්‍රියේ ගමන් කරන්න. සැබැවින්ම රාත්‍රියේදී පෘථිවිය නමාශීලී වේ."(24)

## 24 ගමනේ දී අධික ලෙස ප්‍රාර්ථනාවන්හි නිරත වීම සතුටුදායකය.

එය (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ප්‍රකාශයට අනුගතවය.



«ثَلَاثُ دَعَوَاتٍ مُسْتَجَابَاتٌ لَا شَكَّ فِيهِنَّ: دَعْوَةُ الْمَظْلُومِ، وَدَعْوَةُ الْمُسَافِرِ، وَدَعْوَةُ الْوَالِدِ عَلَى وَلَدِهِ»(25).

"තිදෙනෙකුගේ ප්‍රාර්ථනාවන් කිසිදු සැකයකින් තොරව පිළිගනු ලබති. අසාධාරණයට ලක් වූ තැනැත්තාගේ ප්‍රාර්ථනාව, මගියාගේ ප්‍රාර්ථනාව හා පියකු තම පුතු වෙනුවෙන් කරන ප්‍රාර්ථනාවයි."(25)

(24) මෙය අහ්මද් තුමා තම මුස්නද් නම් කෘතියෙහි හදීස් අංක (10771) යටතේ වාර්තා කර ඇත.

(25) බස්සාර් විසින් ඔහුගේ මුස්නද්හි හදීස් අංක (10068) යටතේ වාර්තා කර ඇත.

# දෙවැන්න: ගමනේ දී පිරිසිදුකම.

## මගියා තම පිරිසිදුකම ගැන සැළකිලිමත් විය යුතුය.

සුළු කිල්ලට හසු වූ විට වුළු කර ගත යුතු අතර, මහා කිල්ලට හසු වූ විට ස්නානය කර ගත යුතුය.

## ඔහුට ජලය නොලැබුණේ නම්

හෝ ඔහුගේ කෑමට හා බීමට අවශ්‍ය සුළු ජල ප්‍රමාණයක් පමණක් ඇත්නම් හෝ ඔහු තයම්මුම් කර ගනී.



## තයම්මුම් කිරීමේ ක්‍රමය:

තම අත් දෙක පොළොවට ගසා ඒ දෙකින් තම මුහුණ හා අත් දෙක පිසදා ගැනීමය.

## තයම්මුම් තුළින් පිරිසිදු වීම තාවකාලික පිරිසිදු වීමකි.

ජලය ලැබුණු විටෙක, එය අවලංගු වේ. එවිට ඔහු ජලය භාවිතා කළ යුතුය. (අමු සැමි ඇසුර වැනි) මහා කිල්ල හේතුවෙන් ඔහු තයම්මුම් කළ විටෙක, **පසුව ජලය ලැබුණේ නම් ඒ සඳහා ස්නානය කර ගැනීම අනිවාර්ය වේ.**

එමෙන්ම මළපහ කිරීම හේතුවෙන් ඔහු තයම්මුම් කළ විටෙක පසුව ඔහු ජලය ලැබුවේ නම්, **එයින් වුළු ගැනීම අනිවාර්ය වේ.** හදීසයක මෙසේ සඳහන් වෙයි.

«الصَّعِيدُ الطَّيِّبُ وَضُوءُ الْمُسْلِمِ وَإِنْ لَمْ يَجِدِ الْمَاءَ عَشْرَ سِنِينَ، فَإِذَا وَجَدَ الْمَاءَ فَلْيَتَّقِ اللهَ، وَلْيُمِسَّهُ بَشَرَتَهُ»[26].

"වසර දහයකට ජලය නොලැබුණ ද, පිරිසිදු පස මුස්ලිම්වරයෙකුගේ වුළු ධෝවණය(ට විකල්පයක්) වේ. නමුත් ජලය ලැබුණු විටක ඔහු අල්ලාහ්ට බියවෙත්වා! ඔහු තම ශරීරය එයින් (ජලයෙන්) තෙමාගත්වා!"[26]

## මේස් සපත්තු මත මස්හ් කිරීම අල්-කුආර්නය,

සුන්නාව හා අහ්ලුස් සුන්නාවරුන්ගේ එකඟතාව අනුව ආගමානුගත කරන ලද්දකි.

## මේස් සපත්තු මත හා එහි අතර්යෙන් පවතින දෑ මත මස්හ් කිරීම සඳහා ඇතැම් කොන්දේසි ඇත:

**1.** සපත්තු දෙක හා මේස් දෙක අනුමත වලංගු පිරිසිදු දෙකක් විය යුතු ය.

**2.** ඒ දෙක පිරිසිදු තත්ත්වයේ පැළඳ තිබිය යුතුය.

**3.** (වුළුවෙහි) අනිවාර්ය ස්ථානය ආවරණය කරන දෙකක් විය යුතුය.



(26) මෙය ඉමාම් බුහාරි විසින් හදීස් අංක 1804 යටතේ වාතර්‍ා කර ඇති අතර, ඉමාම් මුස්ලිම් විසින් ද හදීස් අංක 1927 යටතේ වාතර්‍ා කර ඇත.

## 4.

මස්හ් හෙවත් පිරිමැදීම සිදු විය යුත්තේ සුළු කිල්ලක අවස්ථාවකය. ලිංගිකත්වය හේතුවෙන් ස්නානය අනිවාර්ය වූ අවස්ථාවක හෝ ස්නානය අනිවාර්ය කරන වෙනත් අවස්ථාවක හෝ එසේ පිරිමැදීම වලංගු වන්නේ නැත.

## 5.

ආගමානුගත කළ නියමිත කාලය තුළ පමණක් මස්හ් සිදු විය යුතුය. එනම් පදිංචිකරුවකුට දහවලක් හා රාත්‍රියකි. (දිනකි.) මගියාට දහවල් තුනක් හා ඊට අදාළ රාත්‍රී තුනය. (දින තුනකි.) නිවැරදි ලෙස මෙම කාලය ආරම්භ වනුයේ කිල්ලට හසුවීමෙන් පසු පළමු වතාවට මස්හ් කිරීමට ආරම්භ කළ අවස්ථාවේ සිටය. පසුව පදිංචිකරුට අනුව එතැන් සිට පැය විසිහතරක කාලයක් වලංගු වන අතර ඉන් පසුව කාලය අවසන් වනු ඇත. එමෙන්ම මගියාට අනුව පැය හැත්තෑ දෙකක කාලයක් වලංගු වන අතර ඉන් පසුව කාලය අවසන් වනු ඇත.



## පහත සඳහන් කරුණු තුනෙන් එකක් සිදු වීමෙන් මස්හ් කිරීමේ අවකාශය අවලංගු වී යනු ඇත.

1. අඹු සැමි ලිංගික ඇසුර වැනි ස්නානය කිරීම අනිවාර්ය කරන යමක් සිදු වූ විටෙක, මස්හ් කිරීම අවලංගු වී යනු ඇත. එවිට ස්නානය කිරීම අනිවාර්ය වේ.

2. ඒ දෙක මත මස්හ් කිරීමෙන් පසු ඒ දෙක ගලවා දැමූ විටෙක,

3. ෂරිආව විසින් සලකා බලන ලද කාල සීමාව කල් ඉකුත් වී ඇත්නම්, මස්හ් කිරීම අවලංගු වේ.

* * *



## තුන්වැන්න: ගමනේ දී සලාතය කෙටි කිරීමේ නීතිරීති:

**ගමනේදී සලාත් කෙටි කිරීම එය පූර්ණව ඉටු කිරීමට වඩා උතුම් ය.**

නමුත් මගියා රකආත් හතරේ සලාතය හතරක් ලෙසම පූර්ණවත් කළේ නම්, ඔහුගේ සලාතය නිවැරදි වන නමුත් ඔහු උතුම් දේට පටහැනිව ක්‍රියා කර ඇත.

**මගියා තම ගමේ හෝ නගරයේ සියලුම නිවෙස් හැර දමා බැහැර වූ විටෙක සලාතය කෙටි කරයි.**

මෙය විද්වතුන්ගේ බහුතර මතය වේ.



## සලාතයේ වේලාව පිවිසීමෙන් පසුව ගමන් කළ විටෙක, ඔහුට එය කෙටි කළ හැක.

හේතුව ඔහු අදාළ වේලාව බැහැර වීමට පෙර ගමන් කර ඇති බැවිනි.

## ලුහර් හා අසර් අතරත් මග්රිබ් හා ඉෂා අතරත් ඒකාබද්ධ කිරීම වනාහි,

එය මගියාට අවශ්‍ය අවස්ථාවක ඔහු සතු සුන්නා පිළිවෙතකි. ඔහු ගමන ආරම්භ කර එහි දිගටම නිරත වන විට (පසු සලාතය) පෙරට ගෙනැවිත් හෝ (පෙර සලාතය) පසුවට ගෙන යමින් හෝ තමන්ට වඩාත් පහසු ක්‍රමයක් පිළිපදිමින් ක්‍රියා කරයි.



## සලාතය ඒකාබද්ධ කිරීමට අවශ්‍යතාවක් මගියාට නොමැති විටෙක, **ඔහු එසේ සලාතය ඒකාබද්ධ නො කරයි.**

උදාහරණයක් ලෙස තමන් එක් තැනකට ගොඩ වැදී දෙවන සලාතයේ වේලාව ප්‍රවේශ වීමෙන් පසුව මිස ඔහු ගමන් කිරීමට අපේක්ෂා නොකරන්නේ නම්, එවිට වඩාත් උචිත වනුයේ සලාතය ඒකාබද්ධ නො කිරීමය. මක්නිසාදයත් ඒ සඳහා ඔහුට අවශ්‍යතාවක් නැති බැවිනි. හජ්ජතුල් වදාහි මිනාවට ගොඩවැදුණු අවස්ථාවේ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එසේ සලාතය ඒකාබද්ධ නොකළේ ඒ සඳහා අවශ්‍යතාවක් ඇති නොවූ බැවිනි.

## අතිරේක සලාත් වනාහි,

පදිංචිකරුවා අතිරේක සලාත් ඉටු කරන පරිදි මගියා ද අතිරේක සලාත් ඉටු කරයි. ඔහු ළුහා සලාතය කියාමුල් ලෙයිල් හා අනෙකුත් සලාතයන් ද ඉටු කරයි. නමුත් ළුහර් මග්රිබ් ඉෂා සලාතයන්ට අදාළ සුන්නත් සලාතයන් හැර ඒවා ඉටු නොකිරීම සුන්නාවකි.

**ගමනක දී ගුවන් යානයක හෝ මෝටර් රථයක හෝ නැවක හෝ එවැනි වෙනත් වාහනයක නැග ගමන් කරන්නා අතිරේක සලාතය ඒ මතට වී ඉටු කිරීම වලංගු වන්නේය.**

නමුත් අනිවාර්ය සලාත් වනාහි, අපොහොසත් අවස්ථාවක හැර ඒ සඳහා ගොඩ බැසීම අවශ්‍ය වන්නේය.



# පදිංචිකරුට පිටුපසින් සිට මගියා සලාත් ඉටු කිරීම වලංගු ය.

මගියා ඉමාම්ගේ සලාතය අනුගමනය කරමින් සලාතය ඉටු කරයි. එය සම්පූර්ණ සලාතය හෝ එක් රකආතයක් හෝ ඊට අඩු ප්‍රමාණයක් හෝ ලැබුණත් එලෙසම ය. එය කෙතරම්ද යත්, සලාම් පැවසීමට පෙර අවසන් අත්තහය්යාත් හි ඔහු සමග ප්‍රවේශ වුව ද ඔහු එය සම්පූර්ණ කරයි. විද්වතුන්ගේ ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය එයයි.

## සිව්වැන්න: හජ්, උම්රා හෝ වෙනත් ගමනකින් නැවත හැරී එන විට පිළිපැදිය යුතු දෑ

**නැවත හැරී එනවිට ප්‍රමාදයකින් තොරව ඉක්මණින්ම හැරී ආ යුතුය. කිසිදු අවශ්‍යතාවකින් තොරව දිගු කාලයක් රැඳී නොසිටිය යුතුය.**

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ:

«السَّفَرُ قِطْعَةٌ مِنَ الْعَذَابِ، يَمْنَعُ أَحَدَكُمْ طَعَامَهُ وَشَرَابَهُ وَنَوْمَهُ، فَإِذَا قَضَى نَهْمَتَهُ فَلْيُعَجِّلْ إِلَى أَهْلِهِ» [27].

"ගමන යනු වේදනාවෙන් කොටසකි. ඔබ අතරින් කිසිවෙකු හෝ වේවා ඔහු ඔහුගේ ආහාරය, ඔහුගේ පානය හා ඔහුගේ නින්ද වළක්වා ගනී. ඔබ අතරින් කිසිවෙකුගේ අවශ්‍යතාව හමාර වූ විටෙක, ඔහුගේ පවුල වෙත යාමට ඉක්මන් විය යුතුය."[27]

**ඔහු නැවත තම දේශය බලා හැරී යන්නට සිතූ විටෙක, වාහනය මත නගින අවස්ථාවේ කිව යුතු ගමනේ ප්‍රාර්ථනාව කියවයි.**

ඊට අමතරව පහත ප්‍රාර්ථනාව ද එකතු කර ගනියි.

«آيِبُونَ تَائِبُونَ عَابِدُونَ لِرَبِّنَا حَامِدُونَ» [28].

"ආයිබූන තාඉබූන ආබිදූන ලිරබ්බිනා හාමිදූන්"
(ආපසු හැරී නැවත සේන්දු වූවෙමු, පව්වලට පාපොච්චාරණය කරන්නෙමු, අපගේ පරමාධිපතියාණන්ට නැමැදුම් කර ඔහු ප්‍රශංසා කරන්නෙමු.[28]

---

(27) මෙය ඉමාම් බුහාරි විසින් හදීස් අංක 1797 යටතේ වාතර්‍ා කර ඇති අතර, ඉමාම් මුස්ලිම් විසින් ද හදීස් අංක 1342 යටතේ වාතර්‍ා කර ඇත.

(28) මෙය ඉමාම් බුහාරි විසින් හදීස් අංක (4116) යටතේ වාතර්‍ා කර ඇත.

**ඔහුගේ ගමනින් ඔහු නැවත හැරී එන අතරවාරයේ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසින් තහවුරු කළ ප්‍රාර්ථනාවන් උසුරීම සතුටුදායකය. සැබැවින්ම එතුමාණෝ යම් යුද්ධයකට හෝ හජ් හෝ උම්රා වන්දනාවට පිරිසක් සමග පිටත්ව ගිය විට, මහපොළොවේ උස් ස්ථාන පසු කර යන විට තුන් වරක් තක්බීර් පවසයි.**

«لَا إِلَهَ إِلَّا اللهُ، وَحْدَهُ لَا شَرِيكَ لَهُ، لَهُ الْمُلْكُ، وَلَهُ الْحَمْدُ، وَهُوَ عَلَى كُلِّ شَيْءٍ قَدِيرٌ، آيِبُونَ، تَائِبُونَ، عَابِدُونَ، سَاجِدُونَ، لِرَبِّنَا حَامِدُونَ، صَدَقَ اللهُ وَعْدَهُ، وَنَصَرَ عَبْدَهُ، وَهَزَمَ الْأَحْزَابَ وَحْدَهُ»[29].

"ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහූ, ලහුල් මුල්කු වලහුල් හම්දු, වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්, ආඉබූන තාඉබූන ආබිදූන සාජිදූන ලිරබ්බිනා හාමිදූන. සදකල්ලාහු වඃදහූ, වනසර අබ්දහූ, වහසමල් අහ්සාබ වහ්දහූ"

(නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් කිසිවකු නැත. ඔහුට කිසිදු හවුල්කරුවකු නැත. සියලු රාජ්‍යයන් ඔහු සතුය. සියලු ප්‍රශංසා ද ඔහු සතුය. ඔහු සියලු දෑ කෙරෙහි බලය දරන්නාය. අපි අපගේ පරමාධිපතියාණන්ට ප්‍රශංසා කරමින්, සිරස නමස්කාර කරමින්, නමදිමින්, පාපක්ෂමාව අයැදමින් පැමිණෙන්නෙමු. අල්ලාහ් ඔහුගේ පොරොන්දුව සැබෑ කළේය. තම ගැත්තාට උපකාර කළේය. තනිව සිට සේනාවන් පරාජයට පත් කළේය.)[29]



(29) මෙය ඉමාම් බුහාරි විසින් හදීස් අංක (1797) යටතේ වාතර්ා කර ඇති අතර, ඉමාම් මුස්ලිම් විසින් ද හදීස් අංක (1342) යටතේ ද වාතර්ා කර ඇත.

## ඔහු තම දේශය දුටු විටෙක පහත සඳහන් පරිදි ප්‍රාර්ථනා කිරීම සතුටුදායකය.

«آيِبُونَ تَائِبُونَ عَابِدُونَ لِرَبِّنَا حَامِدُونَ»(30)،

**"ආඉබූන තාඉබූන ආබිදූන සාජිදූන ලිරබ්බිනා හාමිදූන." (අපි අපගේ පරමාධිපතියාණන්ට ප්‍රශංසා කරමින්, සිරස නමස්කාර කරමින්, නමදිමින්, පාපක්ෂමාව අයැදමින් පැමිණෙන්නෙමු.)** (30)

මෙය තම දේශයට ප්‍රවේශ වන තෙක්ම නැවත නැවතත් පවසා සිටියි. එය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ක්‍රියාවට අනුගතවය.

## වෙන්ව සිටි කාලය දිගු කාලයක් වී තිබුණු විටෙක, තමන්ගේ පැමිණීම ගැන තම පවුලට නො දන්වා,

රාත්‍රියේ පැමිණෙන වේලාව ඔවුනට නො දන්වා, රාත්‍රියේ එකවර පැමිණීම යෝග්‍ය නොවේ. මක්නිසාදත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ඒ ගැන තහනම් කර ඇත්තාහ. ජාබිර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාතර්ා කරන ලදී:

«نَهَى رَسُولُ الله صلى الله عليه وسلم أَنْ يَطْرُقَ الرَّجُلُ أَهْلَهُ لَيْلًا»(31)،

**"මිනිසෙකු රාත්‍රී කාලයේ තම නිවැසියන්ට තට්ටු කිරීම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වැළැක්වූහ."**(31)

වෙනත් වාතර්ාවක් පැහැදිලි කරන පරිදි මෙහි ප්‍රඥාව මෙසේය.

«حَتَّى تَمْتَشِطَ الشَّعِثَةُ (32)، وَتَسْتَحِدَّ الْمُغِيبَةُ»(33)،

**"හිසකෙස් පීරා ගන්නා තෙක් (32) වෙන්ව සිටි තැනැත්තිය තම රහස්‍ය පෙදෙසේ රෝම බා ගන්නා තෙක්"**(33)

(30) මෙය ඉමාම් මුස්ලිම් විසින් හදීස් අංක (715) යටතේ වාතර්ා කර ඇත.

(31) 'අෂ්-ෂඃසා' යනු: තෙල් නොගා හිස නො පීරා දිගු කාලයක් හිසකෙස් පවතින තත්ත්වයයි. 'ඉස්තහ්දාද්' යනු: රෝම බෑම සඳහා යම් මෙවලමක් භාවිත කිරීමය. 'අල්-මුගීබා' යනු තම ස්වාමිපුරුෂයා නැති කාන්තාවය. -අත්-තහ්රීර් ෆී ෂහරී සහීහ් මුස්ලිම් - අල්-අස්බහානි (පිටුව: 292).

(32) මෙය ඉමාම් මුස්ලිම් විසින් හදීස් අංක (715) යටතේ වාතර්ා කර ඇත.

(33) මෙය ඉමාම් නසාඊ විසින් හදීස් අංක (9099) යටතේ වාතර්ා කර ඇත.

තවත් වාතර්ාවක

«نَهَى رَسُولُ اللهِ صلى الله عليه وسلم أَنْ يَطْرُقَ الرَّجُلُ أَهْلَهُ لَيْلًا، يَتَخَوَّنُهُمْ أَوْ يَلْتَمِسُ عَثَرَاتِهِمْ»[34].

"තම පවුලේ විශ්වාසවන්තභාවය සැක කරන සහ ඔවුන්ගේ වැරදි ගැන ඔත්තු බලන ආකාරයට (අනපේක්ෂිතව) රාත්‍රී කාලයේ පුද්ගලයකු තම පවුලට පැමිණීම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තහනම් කළහ."[34]

**ගමනක නිරත වී නැවත පැමිණෙන කෙනෙකු තමන්ට අසළින් ඇති මස්ජිදය වෙත ගොස් රකආත් දෙකක් ඉටු කිරීම සතුටුදායක වේ.**

මක්නිසාදයත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එසේ සිදු කර ඇති බැවිනි.



(34) මෙය ඉමාම් මුස්ලිම් විසින් හදීස් අංක (2428) යටතේ වාතර්ා කර ඇත.

**එමෙන්ම ගමනක නිරත වී නැවත පැමිණෙන මගියා තම නිවැසි එමෙන්ම අසල්වාසී දරුවන් සමග ආදරයෙන් කටයුතු කිරීමත්, ඔවුන් ඔහුව මුණ ගැසුණු විටෙක ඔවුන් සමග දැහැමිව කටයුතු කිරීමත් සතුටු දායකය.**

ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාතර්ා කරන ලදී: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මක්කාවට පැමිණි කල්හි, එතුමාණන්ව අබ්දුල් මුත්තලිබ්ගේ කුඩා දරුවන් මුණ ගැසුණු විට අත් දෙකින් එක් දරුවකු ද අනෙක් දරුවා තමන්ට පිටුපසින් ද ඔසුවා ගත්හ. අබ්දුල්ලාහ් ඉබ්නු ජඃෆර් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පැවසූහ:

"كَانَ النَّبِيُّ صَلَّى الله عليه وَسَلَّمَ إِذَا قَدِمَ مِنْ سَفَرٍ تُلُقِّيَ بِنَا، قَالَ: فَتُلُقِّيَ بِي وَبِالْحَسَنِ أَوْ بِالْحُسَيْنِ، قَالَ: فَحَمَلَ أَحَدَنَا بَيْنَ يَدَيْهِ وَالْآخَرَ خَلْفَهُ حَتَّى دَخَلْنَا الْمَدِينَةَ".[35]

**"නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ගමනක් අවසන් කර නැවත පැමිණි විටෙක අප මුණ ගැසෙයි. මාව මෙන්ම හසන්ව හෝ හුසෙයින්ව මුණ ගැසෙයි. හෙතෙම මෙසේ පැවසීය: "අප අතරින් එක් අයකුව එතුමාණන්ගේ ඉදිරියෙන් ද අනෙක් කෙනා එතුමාණන්ගේ පසුපසින් ද සිටින සේ මදීනාව තුළට පිවිසෙන තෙක්ම එතුමාණෝ උසුලාගෙන සිටියහ."**[35]

තෑගිභෝග පිරිනැමීම සතුටුදායකය. එය හදවත් සන්සුන් කර අමනාපකම් ඉවත් කරනු ඇත. එය පිළිගැනීමත් ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමත් සතුටු දායකය.

ආගම තහනම් කළ දෙයක් නිසාවෙන් හැර එය ආපසු හරවා දීම පිළිකුල් සහගතය. මක්නිසාද යත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කර ඇත්තාහ.

«تَهَادُوا تَحَابُّوا»[36]

"ඔබ අන්‍යොන්‍යව ත්‍යාග පිරිනමා ඔබ එකිනෙකා අතර සෙනෙහස ඇති කර ගන්න"[36]

---

(35) මෙය අස්-සුනන් කුබ්රාහි හදීස් අංක (11946) යටතේ බයිහකී තුමා විසින් වාතර්ා කර ඇත.

(36) මෙය අල් අද්බුල් මුෆ්රද් හි හදීස් අංක (97) යටතේ තබරානී තුමා වාතර්ා කර ඇත.

මුස්ලිම්වරුන් අතර සෙනෙහස ඇති වීමට ත්‍යාගය හේතුවක් වේ.



## මගියා තම ගමට හැරී පැමිණි විට වැළඳ ගැනීම ද සතුටු දායක වේ.

මක්නිසාදයත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ සහගාමීන් ඒ ගැන පවසා ඇති බැවිනි. අනස් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පවසා සිටියේය:

**"ඔවුහු එකිනෙකා මුණ ගැසුණු විටෙක, ඔවුන් එකිනෙකා අතට අත දුන් අතර ගමනකින් හැරී ඔවුන් පැමිණි විටෙක, ඔවුන් එකිනෙකා වැළඳ ගත්හ."**(37)

අපගේ නබි මුහම්මද් තුමාණන් හට අල්ලාහ් ශාන්තිය හා සමාදානය ලබා දෙත්වා!

(37) මෙය ඉමාම් බුහාරි විසින් හදීස් අංක (3116) යටතේ වාතර්ා කර ඇති අතර, ඉමාම් මුස්ලිම් විසින් ද හදීස් අංක (100 යටතේ වාතර්ා කර ඇත.

# පටුන


ගමනක පිළිපැදිය යුතු විනය හා එයට අදාළ නීතිරීති. ........ 4

පළමුව: ගමනක පිළිපැදිය යුතු විනය ........ 5

දෙවැන්න: ගමනේ දී පිරිසිදුකම. ........ 19

තුන්වැන්න: ගමනේ දී සලාතය කෙටි කිරීමේ නීතිරීති: ........ 23

සිව්වැන්න: හජ්, උම්රා හෝ වෙනත් ගමනකින් නැවත හැරී එන විට පිළිපැදිය යුතු ආචාර ධර්ම: ........ 27

# تعرف على الإسلام
# بأكثر من 100 لغة

موسوعة القرآن الكريم
QuranEnc.com

ترجمات متقنة لمعاني القرآن الكريم بأكثر من (75) لغة

بيان الإسلام
byenah.com

مواد منتقاة للتعريف بالإسلام وتعليمه بأكثر من (120) لغة

موسوعة الأحاديث النبوية
HadeethEnc.com

ترجمات متقنة للأحاديث النبوية وشروحها بأكثر من (60) لغة

ضيوف الرحمن
hajjumrh.com

مواد منتقاة للحجـــاج والمعتمرين و الزوار بلغات العالم

جامع المحتوى الإسلامي باللغات
islamcontent.com

مواد إسلامية متنوعة وشاملة بأكثر من (125) لغة

موسوعات وخدمات إسلامية باللغات
s.islamenc.com

للمزيد
من المواقع الإسلامية
بلغـــات العـــالم

ضيوف الرحمن
hajjumrh.com

جمعية خدمة المحتوى الإسلامي باللغات